සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 6 ශ්‍රේණිය
## ඉතිහාසය

**නම/විභාග අංකය :-- ..................................................................................    කාලය : පැය 02 යි.**

### I කොටස

- **මෙම කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.**
- ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

(1) අතීත කාලයේ සිට ජීවත් වූ .............................................. පිළිබඳ කථාව ඉතිහාසයයි. (සත්වයින්, මිනිසුන්, උගතුන්)

(2) අතීත කාලවල මිනිසුන් විසින් කළ කී දෑ පිළිබඳ දැන ගැනීමට ඉවහල් වන දෑ .............................................. වේ. (මූලාශ්‍ර, පොත්පත්, පුරාවිද්‍යා මූලාශ්‍ර)

(3) බුද්ධ පරිනිර්වාණය සමග .............................................. ආරම්භ වේ. (ක්‍රිස්තු වර්ෂ, බුද්ධ වර්ෂ, ශක වර්ෂ)

(4) අප ජීවත් වන පෘථිවියේ මුලින් ම ජීවීන් බිහි වූයේ .............................................. ය. (ජලයේ, ගොඩබිම, කඳුකරයේ)

(5) සතුන්ගේ ඇටකටු භාවිත කරමින් නිවාස ඉදි කරන ලද්දේ .............................................. මානවයාය. (හෝමෝ ඉරෙක්ටස්, හෝමො හැබිලස්, හෝමෝ නියන්ඩතාලන්සිස්)

- **අංක 06 - 10 තෙක් ප්‍රකාශ කියවා නිවැරදි නම් 3 ලකුණ ද වැරදි නම් x ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

(6) අතීතයේ මිනිසුන් භාවිත කළ මෙවලම්, පැරණි ගොඩනැගිලි පිළිම ආදිය පුරා විද්‍යා මූලාශ්‍ර වේ. (...........)

(7) ලෝකයේ පැරණි ම අක්ෂර පද්ධතිය නිර්මාණය කළේ මෙසොපොතේමියානු වැසියන් විසිනි. (...........)

(8) විජය කුමරු ඇතුලු පිරිස ගොඩ බසින ලද්දේ තම්බපණ්ණි ප්‍රදේශයටය. (...........)

(9) පෘථිවිය සෑදී ඇත්තේ අහසේ තිබූ නිහාරිකාවක් මගින් බව විද්‍යාඥයින්ගේ මතයයි. (...........)

(10) මුල් වරට රබර් බෝලයක් නිපදවීමේ ගෞරවය හිමි වන්නේ ඊජිප්තු වැසියන්ට ය. (...........)

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල දී ඇති පිළිතුරු අතරින් වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(11) මිනිසා විසින් පළමු වරට ගින්දර භාවිත කිරීම පිළිබඳ සාක්ෂි ලැබෙන්නේ,
(i) චීනයෙනි (ii) ඉන්දියාවෙනි
(iii) ඊශ්‍රායලයෙනි (iv) තුර්කියෙනි

(12) පෘථිවියේ බිහි වූ ජීවයක් සහිත පළමු බැක්ටීරියාව හඳුන්වන්නේ,
(i) ඔපබීනියා (ii) නිහාරිකාව
(iii) ප්‍රොකායෝට් (iv) ඔස්ට්‍රලෝපිතස්

(13) වෙඩි බෙහෙත්, කඩදාසි හා මුද්‍රණ යන්ත්‍රය ආදිය ලොවට හඳුන්වා දුන්නේ,
(i) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයයි. (ii) මෙසපොතේමියානු ශිෂ්ටාචාරයයි.
(iii) චීන ශිෂ්ටාචාරයයි. (iv) ඊජිප්තු ශිෂ්ටාචාරයයි.

(14) පරිනාමයට පත් වූ මානවයන්ගේ ස්ථිර වාසස්ථාන සහිත ගම්මාන බිහි වන්නේ,

(i) මහා හිම යුගයේ ය. (ii) සිලූරියන් යුගයේ ය.

(iii) නව ශිලා යුගයේ ය. (iv) මධ්‍ය ශිලා යුගයේ ය.

(15) නිවාසවල භාවිත කළ දියුණු ජල නල පද්ධතියක් හමු වී ඇත්තේ,

(i) මෙසපොතේමියානු ශිෂ්ටාචාරයෙනි. (ii) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙනි.

(iii) ඊජිප්තු ශිෂ්ටාචාරයෙනි. (iv) චීන ශිෂ්ටාචාරයෙනි.

- **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට හිස්තැන්ට සුදුසු පිළිතුර යොදා සම්පූර්ණ කරන්න.**

(16) මිනිසා දඩයම් කිරීම වෙනුවට ගස්වල ගෙඩි වර්ග අල වර්ග වැඩි වශයෙන් භාවිතා කළේ ................................................ යුගයේ දී ය.

(17) අතීතයේ මෙසපොතේමියාව ලෙස හැඳින් වූ රට වර්තමානයේ හැඳින්වෙන්නේ ................................................ නමිනි.

(18) මෙසපොතේමියානු සමාජයේ ජීවත් වූ උසස් ම පිරිස ලෙස හැඳින් වූයේ ................................................ ය.


(19) මුහුණේ තිබෙන වෙනස්කම් අනුව අප්‍රිකානු ප්‍රදේශවල ජීවත් වන්නේ ................................................ වරුය.

(20) වී වගාව මුලින් ම ආරම්භ කරන ලද්දේ ................................................ ය. (ලකුණු 2x20 = 40)

## II කොටස

- **මෙහි පළමු වන ප්‍රශ්නය අනිවර්ය වේ.**
- **තවත් ප්‍රශ්න හතරකට (4) පිළිතුරු සපයන්න.**
- **ඔබ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

(1) (අ) සපයා ඇති ලෝක සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) B අක්ෂරයෙන් දක්වා ඇති ශිෂ්ටාචාරය නම් කරන්න.

(ii) C අක්ෂරයෙන් දක්වා ඇති ශිෂ්ටාචාරය නම් කරන්න.

(iii) මොංගොලොයිඩ් මානව වර්ගය ජීවත් වන චීනය දක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද?

(iv) කෝකසොයිඩ් මානව වර්ගය ජීවත් වන ඕස්ට්‍රේලියාව දක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 4)

(ආ) (i) මෙම රූපයේ දැක්වෙන්නේ කුමක් ද?

(ii) මෙය අයත් ශිෂ්ටාචාරය කුමක් ද?

(ii) මෙය පිහිටා ඇති නගරය නම් කරන්න.

(iv) මෙම දේවාලයේ ජීවත් වන්නේ කුමන පුද්ගලයන් ද? (ලකුණු 4)





(ඉ) (i) මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක් ද?

(ii) මෙය පිහිටා ඇති නගරය කුමක් ද?

(iii) මෙය කුමන ශිෂ්ටාචාරයට අයත් වී ද?

(iv) මෙහි තැන්පත් කළේ කාගේ මළ සිරුරු ද? (ලකුණු 4)

(2) (i) ඉතිහාසය ඉගෙනීමේ දී වැදගත් වන සාහිත්‍ය මුලාශ්‍ර 2ක් සඳහන් කරන්න. (ලකුණු 3)

(ii) (a) ඉතිහාසය ඉගෙනීමේ දී විවිධ සිදුවීම් අයත් කාලය මැනීමට සුලභව භාවිත වන ක්‍රම 2ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(b) ක්‍රි. ව. 78 දී ඉන්දියාවේ බටහිර ප්‍රදේශ පාලනය කළේ කුමන රජු විසින් ද? (ලකුණු 2)

(iii) (a) ඔබේ පාසලේ ඉතිහාසය හැදෑරීමේ දී වැදගත් වන මූලාශ්‍ර 2ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(b) ඉතිහාසය ඉගෙනීමෙන් ඇති වන ප්‍රයෝජන 3ක් ලියන්න. (ලකුණු 3)

(3) (i) පහත සඳහන් සිද්ධීන් පෘථිවියේ ඇති වූ යුගය පිළිවෙළින් නම් කරන්න.

A - පෘථිවියේ ජලයේ මුල් ම ජීවීන් බිහි වූ යුගය -

B - මුලින් ම ගොඩබිම ශාක පැතිරුන යුගය - (ලකුණු 3)

(ii) පහත සඳහන් ක්‍රියාවන් සිදු කළ මානවයන් නම් කරන්න.

A - දෙපයින් ඇවිදයාමේ හැකියාව -

B - මුවහත් ගල් මෙවලම් භාවිතය -

C - ගින්දර සොයා ගැනීම -

D - අප කාගේත් ළඟ ම නෑයා - (ලකුණු 4)

(iii) (a) වානර පවුලකින් මානව පරම්පරාවක් බිහිවීමට බලපෑ ප්‍රධාන හේතුවක් සඳහන් කරන්න. (ලකුණු 2)

(b) මිනිසා ගින්දර සොයා ගැනීමත් සමග ඇති වූ වාසි 2ක් සඳහන් කරන්න. (ලකුණු 3)

(4) (i) මිනිසා භාවිතා කළ ගල් මෙවලම් වල ස්වරූපය අනුව මිනිසාගේ සංස්කෘතික දියුණුව බෙදා ඇති යුග 3 නම් කරන්න. (ලකුණු 3)

(ii) ගොවිතැන ආරම්භ වූ හොලොසීන යුගයේ ඇති වූ ප්‍රධාන වෙනස්කම් 4ක් සඳහන් කරන්න. (ලකුණු 4)

(iii) මධ්‍ය ශිලා යුගයේ මිනිසා තම ජීවන කටයුතු සිදු කළ ආකාරය පිළිබඳ කරුණු 2ක් මගින් විස්තර කරන්න. (ලකුණු 5)

(5) (i) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් වන රටවල් දෙක නම් කරන්න. (ලකුණු 3)

(ii) (a) මෙම ශිෂ්ටාචාරය පිහිටා ඇති ප්‍රධාන ගංගාව කුමක් ද? (ලකුණු 2)

(b) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය පිහිටි ප්‍රධාන නගර දෙක නම් කරන්න. (ලකුණු 2)

(iii) (a) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් පූජක මූර්තියේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

(b) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ඉතා දියුණු ශිෂ්ටාචාරයක් ලෙස පැවති බවට ලැබෙන සාධක 2ක් සඳහන් කරන්න. (ලකුණු 3)

(6) (i) මෙසපොතේමියානු ශිෂ්ටාචාරය පිහිටා ඇති ගංගා 2ක නම් කරන්න. (ලකුණු 3)

(ii) මෙසපොතේමියානු සමාජය ප්‍රධාන කොටස් හතරකට බෙදා තිබුණි. ඒවා නම් කරන්න. (ලකුණු 4)

(iii) (a) මෙසපොතේමියානු වැසියන් වැදුම් පිදුම් කළ ස්වාභාවික වස්තූන් 2ක නම් කරන්න. (ලකුණු 2)

(b) මෙසපොතේමියානු වැසියන් ඇදහූ පහත සඳහන් ස්වභාවික සිද්ධීන්ට අදාළ දෙවිවරු නම් කරන්න.

දේව මණ්ඩලයේ ප්‍රධානියා වූයේ - -

පොළොවට අධිපති දෙවියා වූයේ -

සුළඟට හා ගොවිතැනට අධිපති දෙවියා - (ලකුණු 3)

(7) (i) ඊජිප්තු ශිෂ්ටාචාරයේ පැවති ගංගාව නම් කරන්න. (ලකුණු 3)

(ii) (a) ඊජිප්තු ශිෂ්ටාචාරය පාලනය කර රජවරු දෙදෙනෙකු හා ඔවුන්ගේ පෙළපත සඳහන් කරන්න. (ලකුණු 3)

(b) ඊජිප්තු වැසියන්ගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය කුමක් ද? (ලකුණු 1)

(iii) (a) ඊජිප්තු වැසියන් ලොවට දායද කළ විශිෂ්ට නිර්මාණ 2ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(b) නොෆාටිටී රැජින ඊජිප්තු ශිෂ්ටාචාරයේ වැදගත් තැනැත්තියක් ලෙස සැලකීමට බලපා ඇති හේතු 2ක් සඳහන් කරන්න. (ලකුණු 3)



For more past papers and exam resources,visit www.pastpaperszone.lk

Answer

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 6 ශ්‍රේණිය
## ඉතිහාසය - පිළිතුරු පත්‍රය

### I කොටස

(1) මිනිසුන්
(2) මූලාශ්‍ර
(3) බුද්ධ වර්ෂ
(4) ජලය
(5) හෝමෝනියන්ඩතාලනිසිස්
(6) 3
(7) 3
(8) 3
(9) 3
(10) x
(11) ඊශ්‍රායලය
(12) ඔස්ට්‍රලෝපිකස්
(13) චීන
(14) නව ශිලා යුගයේ
(15) II ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන්
(16) මධ්‍ය ශිලා යුගයේ
(17) ඉරාකය
(18) පූජකවරු
(19) නිග්‍රොයිඩ්
(20) චීනයේ

### II කොටස

(1) (අ) (i) මෙසපොතේමියානු ශිෂ්ටාචාරය
(ii) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය / මොහොන්ජදාරෝ හරප්පා
(iii) D
(iv) F (ලකුණු 4)

(ආ) (i) සිගුරට් දේවස්ථානයක්
(ii) මෙසපොතේමියාවට
(iii) ඌර්
(iv) පූජකයින් (ලකුණු 4)

(ඉ) (i) ගීසාහි පිරමීඩය
(ii) කයිරෝ
(iv) ඊජිප්තු ශිෂ්ටාචාරයට
(v) රජවරුන්ගේ හා ඔවුන්ගේ බිසෝවරුන්ගේ මමී

(2) (i) මහා වංශය, දීපවංශය
(ii) (a) ක්‍රිස්තු වර්ෂ, බුද්ධ වර්ෂ, ශක වර්ෂ
(b) ගෞතමී පුත්‍ර ශාතකර්නී
(iii)(a) ලොග් පොත, ඇතුළත් වීමේ ලේඛනය, පුවරු
(b) ∟ අන් මත ඉවසීම
∟ ජාතික සමගිය වර්ධනය
∟ විවේචනාත්මකව බැලීම
∟ වර්තමානය සකස් කර ගැනීමට
∟ වර්තමානයේ පවතින ගැටලු විසඳා ගැනීම.
∟ රට ජාතිය පිළිබඳ නිවැරදි අවබෝධයක් ලැබීම.

(3) (i) A - සිලූරියන් යුගය
B - පැලියොසොයික යුගය
(ii) A - ඔස්ට්‍රෝලෝපිකස්
B - හොමෝහැබිලස් / හැකි මිනිසා
C - හොමෝ ඉරෙක්ටස්
D - හොමොසේපියන් / සාපියන්
(iii)(a) ∟ දේශගුණය
∟ අධික ශීතලට ඔරොත්තු දීම.
∟ නුපුරුදු ආහාර ගැනීම.
(b) ∟ ආහාර පුලුස්සා කෑම
∟ ආහාර දිරවීමට පහසු වීම.
∟ ඇඟ උණුසුම් කිරීම.
∟ විනෝද ක්‍රීඩා ලෙස යොදා ගැනීම.
∟ මෙවලම් තැනීම.

**Answer**

(4) (i) පුරා ශිලා යුගය, මධ්‍ය ශිලා යුගය, නව ශිලා යුගය

(ii) L දඩයම් කිරීම වෙනුවට ගොවිතැන් කිරීම.

L ලෝහ වර්ග සොයා ගැනීම

L සතුන් හීලෑ කිරීම

L ධාන්‍ය වර්ග වගා කිරීම

L ස්ථිර වාසස්ථාන සෑදීම.

(iii) L දුනු ඊතල භාවිත කරමින් දඩයම් කිරීම

L දඩයමින් ආහාර එකතු කිරීම

L පසු කාලයේ දඩයම වෙනුවට ගස්වල කොළ අල වර්ග ආහාරයට ගැනීම.

L එක තැනක දිගු කාලයක් ජීවත් වීම.

L දව දඬු හා කොළ අතු භාවිත කරමින් නිවාස සෑදීම.

L ගල් පර්වත බිත්ති මත චිත්‍ර ඇඳීම.

(5) (i) ඉන්දියාව, පකිස්ථානය, ඇෆ්ගනිස්ථානය

(ii) (a) සින්දු නදිය / ඉන්දු නදිය

(b) මොහෙන්ජදාරෝ, හරප්පා, ධොලවීර, කාලිබන්ගන්

(iii) (a) L නලලේ පටියක් දක්නට ලැබීම

L අඩවන් දෙනෙත

L සන්සුන් බව

L භාවනානුයෝගීව සිටීම.

(b) L ප්‍රවාහන පහසුකම් තිබීම

L ක්‍රමවත්ව සකස් කරන ලද කානු පද්ධතිය

L අපද්‍රව්‍ය බැහැර කිරීමට නල පද්ධති තිබීම

L නගර අංග සම්පූර්ණව තිබීම.

L පූජකවරු සිටීම.

(6) (i) යුප්‍රටීස්, ටයිග්‍රිස්

(ii) 1. පූජකයින්

2. ඉහළ පන්තියට අයත් වැසියන්

3. පහළ පන්තිවලට අයත් වැසියන්

4. වහලුන්

(iii)(a) ගංවතුර, වර්ෂාව, සුළඟ

(b) L අනු

L එන්කිකි

L එන්ලිලි

(7) (i) නයිල් නිම්නය

(ii) (a) අක්හෙනතන්, ටුටන්කාමන්, පාරාවෝ රජපෙළපත

(b) කෘෂිකර්මාන්තය

(iii) (a) L පිරමීඩ

L චිත්‍රාක්ෂර භාවිතය

L මළ සිරුරු කල් තබා ගැනීම (මමිකරණය)

(b) L ඇය රූමත් කාන්තාවක් වීම.

L පරාවෝ රජකු වූ අක්හෙනතන් රජුගේ බිසවවීම.

L ඇය අක්හෙනතන් රජුට පසු ඊජිප්තුව පාලනය කිරීම.

L රූමත් බව නිසා ම වර්තමානයේ රූමතියන් තේරීමේ දී ඇයගේ රුව අනුකරණය කිරීම.



For more past papers and exam resources,visit www.pastpaperszone.lk